**පොලිස් ත්‍යාග අරමුදල - 2013**

**------------------------------------**

පොලිස් ත්‍යාග අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරිමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, පොලිස් ආඥාපනතේ (65 අධිකාරිය) 73 (4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.යථෝක්ත මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන 2013 ඔක්තෝබර් 02 දිනැති අංක 03/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ. කෙසේ වුවද මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනිම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරිම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරිම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරිමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයිම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරිම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ.

මාගේ තත්ත්වාගණන විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

**-----------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට පොලිස් ත්‍යාග අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

උසාවි දඩවලට අදාළ ගනුදෙනු මුදල් පදනම මත ගිණුම්ගතකර තිබූ අතර එය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 නොසැසඳූ වෙනස්කම්

සමාලෝචිත වර්ෂය තුළදී සිදුකරන ලද ත්‍යාග ගෙවීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මුදල හා පොලිස් මූලස්ථානයේ අපරාධ අංශය විසින් ඉදිරිපත් කරන ලද වාර්තා අතර රු 30,852,746 ක වෙනසක් නිරීක්ෂණය විය.විස්තර පහත දැක්වේ.

| ගිණුම් විෂය | මූල්‍ය ප්‍රකාශන අනුව මුදල | අපරාධ අංශයේ වාර්තා අනුව මුදල | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| සාමාන්‍ය සහ විශේෂ අග්‍රිම යටතේ ත්‍යාග ගෙවීම් | 422,775,671 | 394,821,675 | 27,953,996 |
| විශේෂ ත්‍යාග ගෙවීම් | 12,090,500 | 9,191,750 | 2,898,750 |
| එකතුව | 434,866,171 | 404,013,425 | 30,852,746 |

වෙනස සඳහා හේතු හඳුනාගෙන ඒ අනුව ගිණුම්වල ගැලපීම් කර නොතිබුණි.

#### 2.2.4 අවිනිශ්චිත ගිණුම

2003 වර්ෂයේ සිට අවිනිශ්චිත ගිණුමේ පැවති රු 48,929 ක්වූ බැර ශේෂය, නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදලට බැර කර තිබුණි.

**2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොලිස් අනුග්‍රාහක අරමුදලට සහ අපරාධ අංශයට ලබා දී තිබුණු පිළිවෙලින් රු. 2,000,000 ක් හා රු. 8000 ක් වූ අත්තිකාරම් වර්ෂ 14 කට වැඩි කාලයක සිට හිඟ හිට පැවතුණි. එම අත්තිකාරම් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට වැඩි කාලයක් හිඟහිට පැවති එකතුව රු. 1,371,166 ක් වූ ලැබිය යුතු උසාවි දඩ මුදල් 2014 අප්‍රේල් 30 වනවිටත් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

**2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු. 64,592,411 ක් වූ විශේෂ ත්‍යාගවලට අදාළ උපලේඛන ,කාල විශ්ලේෂණ ආදී සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.3 චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම**

2006 දෙසැම්බර් 22 දිනැති අංක පී එෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

**3 මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව,සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු. 761,468,308 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.369,271,321 ක් විය.ඒ අනුව රු.392,196,987 කින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි වැඩි වී තිබුණි. එය විශ්ලේෂණය කර පහත දැක්වේ.

| | 2013 | 2012 | ප්‍රවර්ථන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයට බලපෑම හිතකර / (අහිතකර) |
|---|---|---|---|
| <u>ආදායම</u> | රු. | රු. | රු. |
| උසාවි දඩ | 674,698,010 | 684,654,390 | (9,956,380) |
| මෝටර් වාහන දඩ | 77,457,590 | 26,876,352 | 50,581,238 |
| ත්‍රස්ත විමර්ශන ඒකකය | 13,004,477 | - | 13,004,477 |
| ආයෝජන මත ආදායම | 433,474,657 | 278,856,951 | 154,617,706 |
| වෙනත් ආදායම | - | 1,000 | (1,000) |
| මුළු ආදායම | 1,198,634,734 | 990,388,693 | 208,246,041 |

**අඩුකළා-වියදම**

| | | | |
|---|---|---|---|
| ත්‍යාග සහ විනෝදාත්මක කාර්යයන් | (436,966,226) | (620,592,867) | 183,626,641 |
| පරිපාලන වියදම් | (200,200) | (199,050) | (1,150) |
| වෙනත් වියදම් | - | (325,455) | 325,455 |
| **මූලා ප්‍රතිඵලයෙහි වර්ධනය** | **761,468,308** | **369,271,321** | **392,196,987** |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

**පරිත්‍යාග ගෙවීම**

සමාලෝචිත වර්ෂය තුළ පොලිස් නිලධාරින් 275,076 කට රු මිලියන 394.8 ක් වූ ත්‍යාග, පොලිස් ත්‍යාග අරමුදල විසින් ගෙවා තිබූ අතර පෙර වර්ෂයේ පොලිස් නිලධාරින් 396,287 කට රු මිලියන 554.4 ක් ගෙවා තිබුණි.තවද අනාවරණය වූ අපරාධ සඳහා කරන ලද දායකයන්ට අදාළව පොලිස් නිලධාරින් 262 කට හා සිවිල් පුද්ගලයන් 18 කට සමාලෝචිත වර්ෂයේ තුළදී එකතුව රු මිලියන 9.2 ක විශේෂ ත්‍යාග ගෙවා තිබූ අතර පෙර වර්ෂයේ පොලිස් නිලධාරින් 1,232 ක් සඳහා රු මිලියන 29.9 ක මුදලක් ගෙවා තිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදි නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර පොලිස්පතිවරයාගේ අවධානයට යොමුකරන ලදී.පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) උසාවි දඩ එකතු කිරිම.
(ආ) උසාවි දඩ ගිණුම්ගත කිරිම.
(ඇ) ත්‍යාග මුදල් ගෙවීම පිළිබඳ පාලනය